ධනාත්මක සමාජයක් වෙනුවෙන් සෘණාත්මක ලේබල්කරණයන්ගෙන් වළකිමු!
මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් සහ මත්ද්‍රව්‍ය බෙදාහරින්නන් සම්බන්ධයෙන්, සමාජය තුළ ඇත්තේ ගර්හාත්මක, කොන් කිරීමේ ආකල්පයකි. එවැනි ආකල්පයන් තුළින්, මත්ද්‍රව්‍ය පිළිබඳ සමාජ ගැටළුව මැඩ පැවැත්වීමට ද බාධා එල්ල විය හැක.
මෙම කරුණේදී, එවැනි අයවලුන් හැඳින්වීමට මාධ්‍ය විසින් භාවිතා කරනා භාෂාවද දායකත්වයක් නොදක්වන්නේ දැයි Ethics Eye අපි මින් පෙරද බොහෝ විට අසා ඇත්තෙමු.
"කුඩ්ඩා" යන යෙදුම එවැනි භාෂා භාවිතයකට නිදසුනකි.
මැයි 18, 2023 දින දිනමිණ පුවත්පතේ පුවත් වාර්තාවන් දෙකක සිරස්තල තුළ "කුඩ්ඩා" යන යෙදුම සඳහන්ව ඇති ආකාරය, මේ පසුබිම ඔස්සේ සලකා බැලීමට හැක.
2) "කුඩ්ඩා" යන යෙදුම හා බැඳී ඇති ගර්හාත්මක සහ නිෂේධනාත්මක අර්ථය සමඟින්, ඔවුන්ට සමාජයෙන් එල්ල වන කොන් කිරීම වඩාත් තීව්‍ර නොවන්නේ ද?
3) "කුඩ්ඩා" හෝ "මත්ලෝලියා" වැනි යෙදුම් වෙනුවට, "මතට ඇබ්බැහි වූවන්", "මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්" වැනි යෙදුම් වඩාත් යෝග්‍ය වෙතැයි ඔබ නොසිතන්නේ ද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

